## Abstract 44

# ප්‍රාග්බෞද්ධ ජපන් සංස්කෘතිය

**පූජ්‍ය. වීරකැටියේ චන්දානන්ද හිමි,**
(ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර - බෞද්ධ සංස්කෘතිය),
*weerakatiyechandananda@gmail.com*

ප්‍රාග් බෞද්ධ ජපානයෙහි පැවැති සංස්කෘතිකාංග බොහෝමයකි. ස්වභාව ධර්මය ප්‍රමුඛ කොට පැවැති විවිධ චරණයන් ආදී මානවයා පිරූ පිළිවෙත් ද සාම්ප්‍රදායිකව ගලා ආ විවිධ අංගයන් ද මෙහි දී ප්‍රචලිතව පැවතිණි. ඒවා විටෙක සරල මෙන් ම විටෙක සංකීර්ණ බවකින් පැවත ආ බව පෙනේ. ස්වාභාවික වස්තූන් දේවත්වාරෝපණයෙන් සැලකීම මෙන් ම මළවුන් පිදීම ආදී ඇදහිලි හා විශ්වාස ප්‍රාග්බෞද්ධ යුගයේ දී බොහෝ රටවල පැවතියාක් මෙන් ම එය ජපානයට ද ආවේණික වූ සරල ගණයෙහි ලා සැලකිය හැකි සංසිද්ධියකි. අධිරාජයා විසින් ඕනෑ ම අවස්ථාවක තමාගේ අභිමතය පරිදි යටත් වැසියන් පණ පිටින් වළලා මරණයට පත් කිරීම ආදී සිද්ධීන් ද එකල පැවැති රෞද්‍ර, සංකීර්ණ ක්‍රියාවන්ට නිදර්ශන වෙයි. වඩාත් වැදගත් වන්නේ වෙනත් රටවල ප්‍රාග්බෞද්ධ යුගයට අයත් නො වුණු බොහෝ සංස්කෘතිකාංග ජපානයේ පමණක් ශේෂ වීම යි. මෙම පර්යේෂණයේ දී ජපානයේ ප්‍රාග්බෞද්ධ සංස්කෘතිකාංග පිළිබඳ සොයා බැලීම සිදු කෙරෙනුයේ වර්තමානයේ දියුණු හා උසස් සංස්කෘතියක් සහිත ජාතියක් වන ජපන් වැසියන් එම දියුණුව කරා යාමට පෙර සිටි තත්ත්වයන් හඳුනා ගැනීම වැදගත් වන නිසා ය. එසේ ම නූතන ජපානයේ දියුණුවට පදනම් වූහ යි සැලකෙන සෙන් බුදුදහම එම අභියෝග සමතික්‍රමණය කිරීම සඳහා යෙදූ උපාය මාර්ග කවරේ ද යන්න අධ්‍යයනය කිරීමට එය උපස්තම්භක වන හෙයිනි. ජපානයේ බෞද්ධාගමනයෙහි පූර්වාපර සිද්ධි ගවේෂණයට මෙමඟින් ලැබෙන පිටිවහල සෙසු බෞද්ධ රටවල ද මානව සමාජයේ ප්‍රගමනයට බෙහෙවින් අදාළ කරගත හැකි ය. ප්‍රාග්බෞද්ධ ජපන් සංස්කෘතියට විදේශීය බලපෑම මගින් සම්ප්‍රේෂණය වූ නානාවිධ සංස්කෘතිකාංග බහුලව ස්ථාවර වී ඇති බව **කොජිකි** වාර්තාවන්ට අනුව සනාථ වන බව ද මෙහි දී සඳහන් කළ යුතු ය. ජපානයට බුදුදහමෙහි ආගමනය තෙක් පැවැති සියලු සංස්කෘතික ප්‍රවාහයන්ට ''**ෂින්තෝ**'' යන නාමය ව්‍යවහාර කෙරිණි. පශ්චාත්කාලීනව විවිධ අර්ථකථනයන්ගෙන් සම්මිශ්‍රිතව ඉදිරිපත් වූ උක්ත ප්‍රස්තුතය පිළිබඳව ද්විතීයික මූලාශ්‍රය ඇසුරු කරමින් වඩාත් විචාර පූර්වකව අධ්‍යයනය කිරීමට මෙහි ලා අපේක්ෂිත ය.

**ප්‍රමුඛ පද :** ජපානය, ප්‍රාග්බෞද්ධ, බුදුදහම, සංස්කෘතිකාංග, ෂින්තෝ